# අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ

## පොළොන්නරුව තාක්ෂණ උරුම කෞතුකාගාරයේ

## ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණයේ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව තාක්ෂණ උරුම කෞතුකාගාරයේ ප්‍රාථමික ( ශිල්පීය නොවන ) සේවා ගණයේ කෞතුකාගාර සහායක හා කෞතුකාගාර මුරකරු තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණය ( PL-1-2016 )**

- **කෞතුකාගාර මුරකරු (III ශ්‍රේණිය) - පුරප්පාඩු 08**
- **කෞතුකාගාර සහායක (III ශ්‍රේණිය) - පුරප්පාඩු 14**

**02 2.1. අධ්‍යාපන සුදුසුකම් -**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.

**2.2. කායික සුදුසුකම් -**

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**2.3 වැටුප් ක්‍රමය - PL 1 – 2016**

**කෞතුකාගාර මුරකරු**

රු.24250-10x250-10x270-10x300-12x330-36410/- වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවරට බඳවා ගනු ලැබේ.

**කෞතුකාගාර සහායක**

රු.24250-10x250-10x270-10x300-12x330-36410/- වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවරට බඳවා ගනු ලැබේ.

**සටහන :** ඉහත වැටුප් පරිමාණයන් හා ඒ ඒ ශ්‍රේණි වලට අදාළ ආරම්භක වැටුප් පියවරයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපදෙස් වලට යටත් වේ.

**2.4. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි -**

මෙම තනතුරු ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. බඳවා ගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**2.5 බඳවා ගැනීමේ ක්‍රමය -**

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය මත බඳවා ගනු ලැබේ.

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 2. පලපුරුද්ද | 40 |
| 3. ක්ෂේත්‍රයට අදාලව රජය පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා හා ලබා ඇති පුහුණුවීම් | 20 |
| 4. ක්‍රීඩා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් | 15 |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී පිළිඹිබු කරන ආකල්ප හා පෞරුෂය සඳහා | 05 |

**2.6. වෙනත් සුදුසුකම්**

(අ.) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ආ.) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ.) 2018.03.05 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

(ඈ.) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**3. අයදුම්පත් එවිය යුතු ආකාරය -**

- මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කරවාගත් අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

  අංක 01 සිට 08 දක්වා වන ශීර්ෂ 01 වන පිටුවටද , අංක 09 සිට 12 දක්වා වන ශීර්ෂ 02 වන පිටුවටද, අංක 13 සිට 15 දක්වා වන ශීර්ෂ 03 වන පිටුවටද වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුය.

- නියමිත ආකෘතියට අනුකූලව සැකසූ අයදුම්පත් 2018.03.05 දින හෝ එදිනට පෙර ලැබෙනසේ **"අධ්‍යක්ෂ ජනරාල්, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, තැ.පෙ. 854, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 "** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- නියමිත ආකෘතියට සකස් නොකල, නිසියාකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

- අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

- තනතුරු දෙක සඳහාම ඉල්ලුම් කරනු ලබයි නම්, වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**4. අත්සන සහතික කරවා ගැනිම :-**

පූජා ස්ථාන භාර පූජකවරයෙකු /සමාදාන විනිශ්චයකාරවරයෙකු /රජයේ විදුහල්පතිවරයෙකු හෝ 240,360/= ට නොඅඩු ආරම්භක වාර්ෂික වැටුපක් හිමි වැටුප් පරිමාණයක සේවය කරනු ලබන රජයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

**5. වෙනත් -**

**I.** අයදුම්පත් එවීමේදී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ සහතික කල පිටපත් අමුණා එවිය යුතුය. **සහතික කල පිටපත් අමුණා නැති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**II.** මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණක් පිළිබඳව සහ බඳවා ගැනීම් සම්බන්ධව කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
අංක 854, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

## ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ .................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**

| |
|---|
| |

**01.** අයදුම්කරුගේ නම

**1.1**මුලකුරු සමග නම

I. සිංහලෙන්/දෙමළෙන්:-…………………………………………………………………..

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS):-

……………………………………………………………………………………..………

**1.2**මුලකුරුවලින් හැඳින්වෙන නම්:

I. සිංහලෙන්/දෙමළෙන්:-…………………………………………………………………..

II.ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS)

……………………………………………………………………………………..………

**02.** ලිපිනය

I.පෞද්ගලික ලිපිනය :-
……………………………………………………………………………………..…………

……………………………………………………………………………………..…………

II.දිස්ත්‍රික්කය :- …………..……………………………

III.රාජකාරි ලිපිනය (රැකියාවක් කරන්නේ නම්):-……..…………………………….… ….
……………………………………………………………………………………..…………

**03.** ජාතික හැඳුනුම්පත් අංකය **:-**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**04.** ස්ත්‍රී/පුරුෂ භාවය :- **පුරුෂ - 0 (අදාල අංකය කොටුව තුළ ලියන්න)**
**ස්ත්‍රී - 1**

**05.** දුරකථන අංකය පෞද්ගලික:-............................... රාජකාරි:-...............................

**06.** විවාහක/අවිවාහක බව **:-**..............................

**07.** ජන වර්ගය **:-** ..............................

**08.** පුරවැසිභාවය **:-** පරම්පරාවෙන් / ලියාපදිංචි වීමෙන්

**09.** **උපන් දිනය** වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

2018.03.05 දිනට වයස**:-** අවු:- | | | මාස :- | | | දින:- | | |

**10.** **අධ්‍යාපන සුදුසුකම්:**

**I අ.පො.ස (සා./පෙළ) විභාගය:-** පළමුවර / දෙවනවර

විභාග අංකය....................... වර්ෂය........... මාධ්‍යය............

**සමත් වූ විෂයයන්** **ශ්‍රේණිය**

(1).................................. ..............

(2).................................. ..............

(3).................................. ..............

(4).................................. ..............

(5).................................. ..............

(6).................................. ..............

(7).................................. ..............

(8).................................. ..............

සැ.යු.සියළු සහතික වල සහතික පිටපත් අමුණා එවිය යුතුය.

**11. වෘත්තීය දැනුම හා කුසලතාවයන් පිළිබඳ විස්තර**

| පාඨමාලාව | ආයතනය | විෂයයන් | ප්‍රතිඵල |
|---|---|---|---|
| | | | |

සැ.යු.සියළු සහතික වල සහතික පිටපත් අමුණා එවිය යුතුය.

**12.පළපුරුද්ද පිළිබඳ විස්තර:-**

| පළපුරුද්ද | ආයතනය | සේවයේ නියුක්තව සිටි කාලය |
|---|---|---|
| | | |

සැ.යු.සියළු සහතික වල සහතික පිටපත් අමුණා එවිය යුතුය.

**13.** දැනට යම්කිසි තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර:-

1. තනතුර හා ශ්‍රේණිය:-........................................................................
2. පත් වූ දිනය:-..................................................................................
3. ආයතනය:-.........................................................................................
4. විශ්‍රාම වැටුප් සහිත තනතුරක්ද යන වග :-…………………………..

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් , පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි .

................................................ ................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**14.** අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ................................................................ නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු / ඇය මා ඉදිරිපිටදී අත්සන් තබන ලද බවත්, අදාල සහතික පිටපත් අමුණා ඇති බවත් සහතික කරමි.

........................... ...................................................

දිනය සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ නම :-................................................
තනතුර :-................................................
ලිපිනය :-................................................
නිල මුද්‍රාව :-................................................

**15.** රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

.........................................................................................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

.......................................... ...........................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව